# හින්දු ආගම හා බැඳුණු අෂ්ට මූර්ති සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

*සරණකිත්ති, පූජ්‍ය බෙරලිහෙල [1] සහ සීලවිමල, පූජ්‍ය හසලක [2]*

ලොව තුළ පවත්නා භෞතික මානසික සියලු පදාර්ථයන් උත්පාද, ස්ථිති, භංග යන ධර්මතාවන්ගෙන් යුක්තව ක්‍රියාත්මක කරවන්නේ ශිව දෙවියන් බව හින්දූන්ගේ විශ්වාසයයි. ශිව දෙවියන්ගේ නාම ගෝත්‍ර අටක්ද, ඒ හා බැඳුණු මූර්ති අටක්ද, '**අෂ්ට මූර්ති**' යනුවෙන් දක්වා තිබේ. ශිවගේ පහළ වීම බ්‍රහ්මයාගෙන් සිදු වූ අතර, බ්‍රහ්මයා විසින් ශිව හට නම් අටක් හා ඒවා විෂයෙහි ගැළපෙන මූර්ති අටක්ද ලබා දුන් බව '**ශතපත**' නම් ප්‍රකට බ්‍රාහ්මණ ග්‍රන්ථයේ දැක්වේ. එහිදී රුද්‍රඅග්නි මූර්තිය, ශර්වජල මූර්තිය, පශුපතිඕෂධී මූර්තිය, උග්‍රවායු මූර්තිය, අශනිවිද්‍යුත් මූර්තිය, භවපර්ජන්‍ය මූර්තිය, මහාදේවචන්ද්‍ර මූර්තිය, ඊශානසූර්ය මූර්තිය යනුවෙන් ශිව දෙවියන්ගේ නාමයන්ට ආවේණික මූර්ති විග්‍රහ වේ. ශාංඛ්‍යාන, විෂ්ණු පුරාණය හා තන්ත්‍ර ශාස්ත්‍ර ආදි ග්‍රන්ථයන්හි නාමයන් හා ස්වරූප පිළිබඳ සමවිසමතා දැක්වෙන අතර, ඒ පිළිබඳ මෙහිදී අවධානය යොමු වේ. ශිව දෙවියන් සඳහා මෙවැනි නාමයන් ආදේශ කළේ කුමන කරුණක් පදනම් කර ගෙන දැයි විමසා බැලීම වැදගත් වේ. පුරාණ හින්දු ආචාර්යවරුන්ගේ විග්‍රහයට අනුව ඉහත මූර්ති මානව චර්යා හා ප්‍රතිබද්ධව පවතින අතර, එම කරුණු විෂයෙහි ශිව සම්බන්ධ කිරීම ඔහුට කරන ගෞරවයක් සේ සලකන්නට ඇත. ජලය සත්ත්වයාගේ ජීවිතයට අත්‍යවශ්‍ය වන අතර, අග්නිය එදිනෙදා ජීවිතයට මෙන්ම යාගහෝම පැවැත්මටද උපකාරී වේ. සූර්යයා හා චන්ද්‍රයා ලොව පැවැත්ම තහවුරු කරන අතර ආලෝකයද ලබා දෙයි. එසේම ආකාශය හා පෘතුවියද විවිධ අයුරින් පැවැත්මට උපකාරී වන්නකි. මෙසේ විශ්ලේෂණය කොට අෂ්ට මූර්ති සංකල්පය නිර්මාණය කරන්නට ඇත. හින්දු ආගමේ අෂ්ට මූර්ති සංකල්පය විවිධ මූලාශ්‍රයාගත විවරණයන්හි සහ මෙම සංකල්පය අතර විසම ලක්ෂණ දැක්වෙන්නේ කුමන කරුණු පදනම් කොට ගෙනද යන්න මෙහිදී අවධානය යොමු කෙරේ.

**ප්‍රමුඛ පද:** භක්තිය, රුද්‍ර, ශිව ස්වරූප, අෂ්ට මූර්ති

*[1]ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*bsaranakitti91@gmail.com*
*[2]ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*seelawimalah@gmail.com*